මන්නාරම ප්‍රාදේශිය සභාව
මන්නාරම දිස්ත්‍රික්කය
------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 24 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජනවාරි 24 වන දින ද සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
----------------------------------

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මන්නාරම ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දන්නා මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
-------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
--------------------------

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති හා අංක පීඑල්/05/පීජ්/එස්එෆ්පීඑස්ජ්එස් දරණ චක්‍ර ලේඛය පරිදි රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල විෂයයන් 19 කට අදාල එකතුව රු. 630,718 ක මුදලක් වැරදි ලෙස වර්ග කර තිබුණි.

1.3.3 ගෙවිය යුතු ගිණුම්
---------------------

පසුගිය වර්ෂ වලට අදාල පියවිය යුතු අයිතම දෙකක එකතුව වූ රු. 883,329 ක මුදල මෙම වාර්තාවේ දිනය දක්වා පියවීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 නීති , රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති , රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් විගනණයේදී නිරීක්ෂණය විය.

| නීති , රීති හා රෙගුලාසි සඳහා යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශිය සභා රීති සංග්‍රහය | |
| රීති අංක 5 (XII) | මූල්‍ය හා ගබඩා ගණුදෙණු පිළිබඳ වගකිව යුතු නිළධාරීන් වෙතින් ප්‍රමාණවත් ඇපකර ලබාගෙන නොතිබුණි. |
| (ආ) 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා ආඥා පනත | |
| I. 126 වගන්තිය | සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත කරන ලද දූරකථනසම්ප්‍රේෂණ කුළුණු සඳහා ස්ථාපනය කිරීමේ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| II. 150 (1) වගන්තිය | ව්‍යාපාර පිළිබඳ රෙජිස්ටරයක් සකස් කර වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| I. මුදල් රෙගුලාසි 371 (2) හා (5) | රු. 175,000 ක් වටිනා අතුරු ආග්‍රිමයන් කාල පමාවකින් පියවා තිබුණි. |
| II. මුදල් රෙගුලාසි 571 | රු. 891,804 ක් වටිනා පොදු තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,340,703 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,083,000 ක් විය. මේ අනුව රු. 2, 257, 703 කින් මූල්‍ය ප්‍රතිඵලය වර්ධනව වී තිබූ අතර රාජ්‍ය ප්‍රධාන ලැබීම් හා ආදායම් වැඩිවීම ඊට හේතු වී තිබුණි.

2.2 ආදායම් කළමණාකරණය

2.2.1 ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය

සභාව විසින් ප්‍රවර්ථන වර්ෂය වෙනුවෙන් අයවැය ගත කළ ආදායම හා රුස්කල සත්‍ය ආදායම අතර රු.1,056,122 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.2 බදු කුලී

සභාව සතු උප කාර්යාල 03 කට අයත්ව පවතින පොදු වෙළඳසැල් හා මස් කඩ අලෙවිසැල් වලින් ලැබිය යුතු රු. 969,485 ක මුදලක් මෙම වාර්තාවේ දිනය දක්වා අයකර ගැනීමට සභාව මගින් සැලකිය යුතු පියවරයන් ගෙන නොතිබුණි.

2.2.3 අනෙකුත් ආදායම්

දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 05 කට අදාලව අයවිය යුතු ස්ථාපනය කිරීමේ ගාස්තු රු. 105,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙතින් 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අයවිය යුතු රු. 28,068,038 ක මුද්දර ගාස්තු අයකර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ දුර්වලතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 17 කට අදාලව ලොග් සටහන් පොත් නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 12 කට අදාලව ප්‍රවර්ථන වර්ෂයේ ආදායම් බදු සහතික ලබා ගැනීම හා රක්ෂණ සහතික ලබා ගැනීම සිදුකර නොතිබුණි.

(ඇ) ප්‍රවර්තන වර්ෂයේදී සභාව විසින් භාවිතා කරන ලද වාහන 07 කට යෙදවූ රු. 82,650 ක් වටිනා ඉන්ධන ලීටර් 870 ක් ධාවන සටහන් වල ඇතුලත් කර නොතිබුණි.

(ඉ) 2015 ඔක්තෝබර් 20 දින E/1 099140 දරන ඉන්ධන ඇණවුම මගින් ඉන්ධන ලීටර් 50 ක් භාවිතයට ගත නොහැකි අංක 53-3325 දරන අබලන් මෝටර් රථයක් වෙනුවෙන් යොදවා තිබුණි.

(ඊ) ට්‍රැක්ටර් ට්‍රෙලර් 03 ක් භාවිතා නොකර ඌණ උපයෝගිව තබා තිබුණි.

3.2 කාර්යසාධන වාර්තාව

-------------------------

මහා භාණ්ඩාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2010 මාර්තු 10 දිනැති හා අංක PF/R/2/2/3/5/(4) දරන ලිපියෙහි 1.4.1 වගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාවක් සකස් කළ යුතු වුවත් සභාව විසින් ප්‍රවර්ථන වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

----------------------------------------

අයවැය පාලනය

-------------------

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ප්‍රවර්ථන වර්ෂය සඳහා අයවැය ලේඛණය අනුව වැය විෂයන් 38 ක් සඳහා වෙන්කරන ලද රු. 2,985,444 ක ප්‍රතිපාදන සියයට 40 සිට සියයට 100 දක්වා භාවිතා නොකර ඉතිරි කර තිබුණි.

(ආ) ප්‍රවර්ථන වර්ෂය සඳහා අයවැය ලේඛණය අනුව මූලධන වැය විෂයන් 03 කට අදාලව වෙන්කරන ලද රු. 736,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් භාවිතා නොකර ඉතිරි කර තිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ආදායම් රැස්කිරීම්

(ආ) අයවැය පාලනය

(ඇ) ලැබිය යුතු ගිණුම්

(ඈ) ස්ථාවර තැන්පතු

(ඉ) අත්තිකාරම් රෙජිස්ටර් නඩත්තුව

(ඊ) වැය ලෙජර නඩත්තුව

(උ) නිළධාරීන්ගේ ආපදා ණය අයකර ගැනීමේ ලේඛණ නඩත්තුව